# පුරාවිද්‍යා උරුම ආරක්ෂා කරමු

පී. අනුරාධා තෙන්නකෝන්[57]

---

මිනිස් සංහතියේ අතීත පණිවිඩයන් රැගෙන ඔවුන්ගේ පෞරාණික සම්ප්‍රාධයත් මේ යැයි සජීවී ව දක්වන සාධක වශයෙන් ඓතිහාසික ස්මාරක අද දක්වාත් ශේෂ ව පවතී. පුරාවිද්‍යාත්මක පර්යේෂණ වාර්තා අනුව පුරාවිද්‍යා ස්ථානයන් බොහෝමයක් දක්නට ලැබෙන්නේ උතුරු මැද පළාතේ ය. එයින් අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රධාන වේ. වර්තමානය වන විට මෙම පළාතේ පුරාවිද්‍යා ස්ථාන විනාශයට පත්වෙමින් පවතින ආකාරය දැකගත හැකි ය. ඒ ඔස්සේ සිදු කළ පුරාවිද්‍යාත්මක ගවේෂණයක දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පෙරියකුළම ගම්මානය තුළ සැගව පැවතින විනාශයට ලක්වෙමින් පවතින පුරාවිද්‍යාත්මක වශයෙන් අතිශය වැදගත් සැඟවුණු පුරාවිද්‍යා ස්ථානයක් හමු විය. විනාශයට පත්වෙමින් පවතින අපේ උරුමයන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් වර්තමානය වන විට එම ස්ථානය පවතින තත්ත්වය පිළිබඳව තොරතුරු ගවේෂණයට අදහස් කළෙමි. එම ස්ථානය පිහිටි ගම්මානයේ ගම්වාසීන්ගෙන් තොරතුරු ලබා ගැනීම ඔස්සේ එම පුරාවිද්‍යාත්මක උරුමය තහවුරු කර ගැනීම සඳහා ගවේෂණය කරන ලදි. වර්තමානයේ එම ස්ථානය වෙහෙරකැටිය යන නාමයෙන් හඳුන්වනු ලබ යි. ගම්වාසීන්ගෙන් ලද තොරතුරු අනුව අදාළ තොරතුරු තහවුරු කර ගැනීමට හැකියාව ලැබු ණි. එම තොරතුරු වලට අනුව මෙම ස්ථානය ආරෝග්‍යශාලාවක් බව විශ්වාස කළ හැකි වේ. තව ද එම ස්ථානය තුළ භික්ෂූන් වහන්සේලා වැඩසිටි බවට ද සාධක බොහෝමයක් පවතී. ඉහත කරුණු අනුව මෙම වෙහෙරකැටිය නම් ස්ථානය තුළ දැකගත හැකි දත්තයන් අනුව පස් වලින් වැසී ගිය වෙහෙරක් හා හිටි බුදු පිළිමයක කොටස් දැකගත හැකි ය. බෙහෙත් ඔරුවක් හා බෙහෙත් ඇඹරීම සඳහා භාවිත කළ ගලක් ද දැකගත හැකි වේ. ගල් කණු ද විශාල ප්‍රමාණයක් දැකගත හැකි අතර මෙවැනි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථානයක් වශයෙන් එය ආරක්ෂා කර ගැනීම වගකීමක් හා එය වාර්තාගත කිරීම හා අධ්‍යයනය කිරීම ද වැදගත් වේ.

ප්‍රමුඛ පදඃ පුරාවිද්‍යා උරුමය, වෙහෙරකැටිය පුරාවිද්‍යා ස්ථානය.

---

[57] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.